P.T.O.

කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තුන්වන වසර පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2016/2017

**SOC 3173 – නව සම්භාව්‍ය සමාජ විද්‍යාත්මක න්‍යාය**

පැ. දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න

---

1. 'ටැල්කොට් පාර්සන්ස් 'අභිප්‍රේරිත අනුගතවීම' අදාළ කරගනිමින් සමාජ ජීවිතය පිළිබඳ චිත්‍රයක් ඉදිරිපත් කළේය'. න්‍යායික සංකල්ප යොදා ගනිමින් සහ උදාහරණ සපයමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

2. සංකේතීය අන්තර්ක්‍රියාවේදී පර්යාලෝකයට මඟ පෙන්වන කේන්ද්‍රීය සංකල්ප ජෝර්ජ් හර්බර්ට් මීඩ් සහ හර්බර්ට් බ්ලූමර්ගේ න්‍යාය ගැන්වීම් සන්දර්භයෙහි විභාග කරන්න.

3. ආයතන තුළ පුද්ගලයා තමා පිළිබඳ හැඟීමක් (sense of self) ගොඩනගා එය සන්නිවේදනය කරන ආකාරය අර්වින් ගොෆ්මන්ගේ නාට්‍ය කලා ආකෘතිය ඇසුරෙන් විශ්ලේෂණය කරන්න.

4. ඇල්ෆ්‍රඩ් ෂුට්ස්ට අනුව, 'මිනිසුන් සිය අත්දැකීම් තුළ එක් අර්ථය පිළිබඳ පරිච්ඡින්න (සීමිත) කලාපයක් එනම්, එදිනෙදා ජීවිතයේ ලෝකය, පරම යථාර්ථය වශයෙන් සලකයි'. ෂුට්ස් මානව සමාජ ජීවිතය පිළිබඳ සිය විශ්ලේෂණය තුළ මෙම නිගමනයට පිවිසෙන්නේ කෙසේ දැයි විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

5. එදිනෙදා සංවාද සමාජයේ සාමාජිකයින් අතර බෙදා ගන්නා වූ 'පසුබිම් අපේක්ෂාවන්' මත සංවිධානය වී ඇත්තේ කෙසේ දැයි හැරොල්ඩ් ගාර්ෆින්කල් සිය සිසුන් සමඟ සිදුකළ පර්යේෂණ ඇසුරෙන් විදහා දක්වන්න.

අ.පි.බ

6. පහත සඳහන් ඕනෑම මාතෘකා <u>**තුනක් (03)**</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ග්‍රාම්ෂි සහ ආධිපත්‍ය/අණසක

(ii) ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය සහ ධනවාදයේ සංස්කෘතිය

(iii) සොසුයියෝර්ගේ ව්‍යුහාත්මක වාග්විද්‍යාව

(iv) රෝලන්ඩ් බාත් සහ පුරාණෝක්තිය

(v) අල්තුසර් සහ මතවාදී රාජ්‍ය යාන්ත්‍රණය

(vi) ලේබල් ඇලවීමේ න්‍යාය

********************